(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 2(5).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 මැයි 17 වැනි සිකුරාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 61/'19

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු විමල් රාජපක්ෂ මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා
ගරු කනක හේරත් මහතා
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු රොෂාන් රණසිංහ මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු එස්. බී. දිසානායක මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු සී. බී. රත්නායක මහතා
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු   ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා
ගරු   සිසිර ජයකොඩි මහතා
ගරු   එස්. ප්‍රේමරත්න මහතා
ගරු   සාලින්ද දිසානායක මහතා
ගරු   තාරානාත් බස්නායක මහතා
ගරු   අශෝක ප්‍රියන්ත මහතා
ගරු   ජානක වක්කුඹුර මහතා
ගරු   එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු   ඩිලාන් පෙරේරා මහතා
ගරු   අරුන්දික ප්‍රනාන්දු මහතා
ගරු   විදුර වික්‍රමනායක මහතා
ගරු   අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු   නිමල් ලාන්සා මහතා
ගරු   ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු   තිලංග සුමතිපාල මහතා
ගරු   ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
ගරු   සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු   (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු   ගාමිණී ලොකුගේ මහතා
ගරු   නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
ගරු   විජිත බේරුගොඩ මහතා
ගරු   ලොහාන් රත්වත්තේ මහතා
ගරු   ආනන්ද අලුත්ගමගේ මහතා
ගරු   දිළුම් අමුණුගම මහතා
ගරු   මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු   මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු   ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු   පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු   රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු   සිරිපාල ගමලත් මහතා
ගරු   ඩුලිප් විජේසේකර මහතා
ගරු   විමලවීර දිසානායක මහතා
ගරු   ප්‍රේමලාල් ජයසේකර මහතා
ගරු   පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
ගරු   අනුරාධ ජයරත්න මහතා
ගරු   එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු ජයන්ත සමරවීර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

පාස්කු ඉරිදා ත්‍රස්තවාදි ප්‍රහාරය ලෙස හඳුන්වන 2019 අප්‍රේල් 21 දින කිතුනු පල්ලි සහ හෝටල් ඇතුළු ස්ථාන නවයකට එල්ල වුණු ත්‍රස්තවාදි ප්‍රහාර සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුවන් නිදහස් කරන මෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ හමුදාපතිවරයාට බලපෑම් කරනු ලැබූ බවට හමුදාපතිවරයා විසින් 2019 මැයි 5 දින සිළුමිණ පුවත්පතට ප්‍රකාශ කරනු ලැබ තිබූ හෙයින් ද;

සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය එල්ල කරනු ලැබූ ඉම්ෂාන් අහ්මඩ් ඊබ්‍රාහිම්ට හිමි කර්මාන්ත ශාලාවට සම්මතයට පටහැනිව කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන් හිස් පතොරම් කොපු සපයා ඇති හෙයින් ද;

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රණවිරුවන් අධිකරණයට ඉදිරිපත් කර වසරකට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතකිරීමට කටයුතු කළ ශ්‍රී ලංකා පොලීසිය, බෝම්බ නිෂ්පාදනය කිරීමට කටයුතු කළ බවට සැක කරන එකී කම්හලේ සේවකයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිකරණයට ඉදිරිපත් නොකර 2019.05.06 දින ඔවුන්ට ඇප ගැනීමට ඉඩ සැලැස්වීමෙන් දේශපාලන බලපෑමක් ඇති බවට සාධාරණ සැකයක් මතු වන හෙයින් ද;

රිසාඩ් බදියුදීන් අමාත්‍යවරයා නායකත්වය දරන සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ, භාණ්ඩාගාරික වන එස්. කේ. පී. අලහුඩීන් ත්‍රස්තවාදීන්ගේ ප්‍රයත්නයන් පිළිබඳ යථා තොරතුරු දැන සිට එය බලධාරින්ට හෙළි නොකර සිටීමෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිමය කටයුතු කළ හැකිව තිබියදී එසේ නොකළ හෙයින් ද;

අමාත්‍යවරයාගේ ප්‍රබල හිතවතෙකු වන අල්හාජ් මොහොමඩ් ඊබ්‍රාහිම් යුසුෆ් ඊබ්‍රාහිම්ගේ පුතුන් දෙදෙනෙකු මරාගෙන මැරෙන ත්‍රස්තවාදින් ලෙස කටයුතු කළ හෙයින් ද;

සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ද වන අමාත්‍යවරයාගේ සම්බන්ධිකරණ ලේකම්වරයෙකු ලෙස පෙනී සිටි අබ්දුල් හනුත් ත්‍රස්තවාදී සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට ගෙන ඇති හෙයින් ද;

අමාත්‍යවරයාගේ උපදේශකවරයෙකු ලෙස පෙනී සිටින මවුලවිවරයෙකු ත්‍රස්තවාදි සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට ගෙන ඇති හෙයින් ද;

අමාත්‍යවරයාගේ සහෝදරයෙකු වන රිෆ්කාන් බදියුදීන් යුද හමුදාව විසින් අත්අඩංගුවට ගෙන මන්නාරම පොලීසියට භාර දීමෙන් පසු උසාවියට ඉදිරිපත් නොකර බලපෑම් මත නිදහස් කළ හෙයින් ද;

පාස්කු ඉරු දින ත්‍රස්තවාදී ප්‍රහාරය සම්බන්ධ විමර්ශනයන්ට අමාත්‍යවරයා විසින් අනිසි බලපෑම් කරන බවට ආරක්ෂක හමුදා සහ පොලීසියේ නිලධාරින් පවසන තොරතුරු මත සමාජයේ ප්‍රබල මතයක් මතු වී ඇති හෙයින්; සහ

ත්‍රස්තවාදින් සහ අමාත්‍යවරයා අතර ප්‍රබල සම්බන්ධයක් ඇති බවට මතු වන සැකය පැහැදිලිව තහවුරු වී තිබිය දී, අමාත්‍යවරයාගෙන් මේ පිළිබඳ ප්‍රශ්න කිරීමට පොලීසිය මෙතෙක් අසමත් වීමෙන් එතුමා විසින් අමාත්‍යධූරය දැරීම විර්මශන කටයුතු සඳහා බාධාවක් බවට පෙනී යන හෙයින් ද;

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය රිසාඩ් බදියුදීන් මහතාට තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.